# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2092/12 - 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා - 2018.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු ඉඩමේ/පරවශතාවය විස්තර:*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 243L පුලියංකුලම් ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සර්වේ ජනරාල් විසින් 2018.08.20 දිනැතිව පිළියෙල කරන ලද FVP 27, දරණ පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 11.9945 පමණ වූ කැබලි අංක 1375 දක්වා ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

01. කැබලි අංක 1375

ප්‍රමාණය: හෙක්ටයාර් 11.9945.

***මායිම් :***

*උතුරට*: කැබලි අංක 39, 38 සහ 30; *නැගෙනහිරට*: කැබලි අංක 7, 1373, 7, 1374, 7, 30, 40, 45 සහ 55ඒ; *දකුණට*: කැබලි අංක 30, 40, 45, 55ඒ සහ 1378; *බටහිරට*: කැබලි අංක 1376, 1377, 55ඒ, 39, 38 සහ 30.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 නොවැම්බර් මස 12 වැනි දින පෙ.ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 ඔක්තෝබර් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ.එස්.අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් ,
ත්‍රිකුණාමලය.

2018 ක්වූ ඔක්තෝබර් මස 02 වැනි දින,
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1252


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 28678 - 37 (2018/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.